**කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව- 2020**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**---------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාවේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් වත්කම් පන්ති දෙකක පිරිවැය රු.11,045,012 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධන කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | පිරිවැය රු 11,045,012 ක් වන ස්ථාවර වත්කම් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව ඵලදායී ජීවකාලය නැවත සමාලෝචනය කර ඉදිරි ගිණුම් වර්ෂය තුළදී අදාළ වත්කම් තුළ ගැලපීම් කිරීමට කටයුතු කරමි. | ඵලදායී ජීවිත කාලය සමාලෝචනයට භාජනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සඳහා, පර්යේෂණ ආයතන 3 කට හා විශ්වවිද්‍යාල 3 කට ලබාදුන් මුදල්වලින්, ප්‍රතිපත්ති සභාව වෙත පියවිය යුතු රු.659,131 ක මුදල මෙතෙක් අයකර ගැනීමට කටයුතු නොකර 2006 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතී. | සභාව වෙත අය කර ගැනීමට පවතින රු. 659,131 ක මුදල ඉදිරි ගිණුම් වර්ෂය තුළ නිරවුල් කර ගැනීමට පියවර ගනිමි. | අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,563,922 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 6,552,181 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 14,116,103 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු. 39,942,557 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව දැනට පවත්වාගෙන යන ගොඩනැගිලි පරිශ්‍රයට නව කොටසක් එකතු කිරීම වෙනුවෙන් 2019 වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු. 2,460,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර, 2021 මැයි 7 දින දක්වාත් ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. | ගොඩනැගිලි පරිශ්‍රයට නව කොටසක් එකතු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව රු. 2,460,000 ක අත්තිකාරම් මුදලක් 2019 වර්ෂයේදී ගෙවා වැඩ ආරම්භ කරන ලදී. ගිවිසුම් ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් සිදු කළ ද සභාව වෙත ප්‍රමාණවත් පරිදි ප්‍රාග්ධන මුදල් ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් ගිවිසුම ප්‍රකාරව මුදල් ගෙවීමට ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවට නොහැකි විය. ඒ හේතුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ලබා දී තිබූ ආයතනය සභාවේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කරන ලදී. ගෙවිය යුතුව තිබූ හිඟ මුදල වන රු. 1,672,303 ක මුදලක් 2021 ජූලි 06 දින ගෙවීම් කිරීමෙන් පසු ඉදිකිරීම් කටයුතු නුදුරේ දී ආරම්භ කරන බව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. | ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු නිමකරවා ගත යුතු වීම. |
| (ආ) 2019 වර්ෂයේදී තනතුරු 5 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම්, ලිඛිත පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණ වෙනුවෙන් රු. 384,040 ක වියදමක් දරා තිබූ නමුත්, අනුමත කාර්ය මණ්ඩල තනතුරු 9 ක් සඳහා වර්ෂ කිහිපයක සිට පවතින පුරප්පාඩු 10 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද නිලධාරීන් බඳවාගෙන නොතිබුණි. | පුවත්පත් දැන්වීම් පළ කර අයදුම්පත්‍ර කැඳවා, බඳවා ගැනීමට අදාළ මූලික කාර්යයන් සිදුකෙරෙමින් පවතින අතරතුරේ දී කළමනාකරණ සේවා චක්‍රලේඛ 2020/01 පරිදි සියලුම බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවන ලදී. එබැවින් පුරප්පාඩු පිරවීමට නොහැකි වූ බව දන්වා සිටිමි. මුදල් අමාත්‍යාංශයේ අංක 2020/02 චක්‍රලේඛය ප්‍රකාරව පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින අතර ඒ අනුව පුරප්පාඩුව පැවති ගණකාධිකාරී තනතුර හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ කළමනාකරණ) තනතුරු සඳහා බඳවා ගැනීම අවසන් කර ඇත. | කඩිනමින් පවතින පුරප්පාඩු පිරවිය යුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සභාව විසින් කාබනික කෘෂිකර්මාන්තය සඳහා අවධානය යොමු කිරීමේ වැදගත්කම හඳුනාගෙන එම ක්ෂෙත්‍රයන්හි පර්යේෂණ වැඩි කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර 07 ක් ශ්‍රී ලංකාවේ පවතින පර්යේෂණ ආයතන වෙත හඳුන්වාදී තිබුණද, කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සහ වර්තමානයේ වෙළඳපලේ පවතින කාබනික ආහාරවල ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම සඳහා 2017 වර්ෂයේ සිට පර්යේෂණ ආයතන උනන්දු කර නොතිබුණි. | ජාතික පර්යේෂණ ප්‍රතිපත්තිය හා පර්යේෂණ ප්‍රමුඛතා සැකසීම වැනි කාර්යයන් අප ආයතනයට අදාළ කාර්යයභාරයක් වන අතර ජාතික පර්යේෂණ ප්‍රමුඛතා සැකසීම අප ආයතනය විසින් සිදු කරයි. එම ප්‍රමුඛතා අනුව පර්යේෂණ සිදු කිරීම සිදු කරනු ලබන්නේ පර්යේෂණ ආයතන මඟිනි. අප ආයතනය මඟින් පර්යේෂණ සිදු නොකරයි. | පර්යේෂණ ආයතන 24 ට අදාළව මෙම ප්‍රමුඛතා හඳුන්වා දෙනු ලබන බැවින් එම ආයතන මෙම පර්යේෂණ සිදුකිරීමට උනන්දු කළ යුතු වීම. |
| (ආ) කෘෂිකර්ම පර්යේෂණ ආයතනවලින් කැඳවනු ලැබූ පර්යේෂණ යෝජනා වලින් ව්‍යාපෘති 02 ක් සඳහා අරමුදල් සැපයීමට 2019 වර්ෂයේදී සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී හෝ අරමුදල් සපයා නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළව නව යෝජනා හඳුනාගෙනද නොතිබුණි. | නව ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේ දී අරමුදල් නොතිබුණි. එබැවින් නව ව්‍යාපෘති සඳහා අරමුදල් ප්‍රදානය නොකරන ලදී. | නව ව්‍යාපෘති ආරම්භ කිරීමටත්, පවතින ව්‍යාපෘති නියමිත කාලයට නිම කිරීමටත්, ව්‍යාපෘති ප්‍රගතිය භෞතිකව පරීක්ෂා කිරීමටත් සුදුසු පියවර ගත යුතු වීම. |
| (ඇ) කෘෂිකාර්මික පර්යේෂණ ආයතනවල සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව, පර්යේෂණ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම, පර්යේෂක (Research officer), විද්‍යාඥ ( Scientist) හා අනෙකුත් කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු සහ ආයතන සතු භෞතික සම්පත් පිළිබඳවත් තොරතුරු 2019 වර්ෂය දක්වා රැස්කර දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම (Information for Agricultural Research Managers) කර තිබුණද, 2010 වර්ෂයෙන් පසු එම තොරතුරු ඇතුළත් වාර්ෂිකව නිකුත් කළ යුතු ප්‍රකාශන නිකුත් කර නොතිබුණි. | 2019 වර්ෂය දක්වා දත්ත රැස් කර දත්ත පද්ධතිය (Information for Agricultural Research Managers) යාවත්කාලීන කර ඇත. 2018 වර්ෂය දක්වා වූ ප්‍රකාශනය ඉතා කඩිනමින් මුද්‍රණය කර නිකුත් කිරීමට නියමිතය. ඒ සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීමට සටහන් කර ගතිමි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව පද්ධතිය යාවත්කාලීන කර වාර්ෂික ප්‍රකාශන නිකුත් කළ යුතු වීම. |